ආචාර්ය ගුණපාල මලලසේකර මහතා .........................

ලොව ප්‍රාචීන අධ්‍යාපනයන් පිළිබඳ කීර්තිමත් මහැදුරකු වූ ආචාර්ය  ජී.පී.මලලසේකර විසිවැනි සියවසෙහි ශ්‍රී ලංකාවේ විසූ  විද්වතුන් අතර මැණිකක් බඳු විය.  පාලි සහ බෞද්ධ ශිෂ්ඨාචාරය පිළිබඳ මහැදුරකු ලෙස විද්වත් ප්‍රජාව උදෙසා  සේවය කරන අතරම බෞද්ධයින්ගේ උන්නතිය උදෙසා විවිධ අයුරින් ඔහු නිරතුරුවම ක්‍රියාකාරී  විය.  මේ සඳහා හෙතෙම සමස්ත ලංකා බෞද්ධ සම්මේලනය උපයෝගී කර ගනු ලැබූ අතර දශක හතරක කාල සීමාවක් තුළ එහි විවිධ තනතුරු , එනම් සමලේකම් (1925 – 1926), සභාපති(1939 – 1957) සහ බොහෝ දෙනෙකුට ප්‍රියමනාප වූ අනුශාසක පදවිය ද දරමින් කටයුතු කළහ.

මෙම ආයතනයේ ශක්‍යතාව උපරිම තලයකට ලඟා වන පරිදි ශක්තිමත් කිරීමට සැළැකිය යුතු මට්ටමකින් උපකාරී වූ මෙම විශිෂ්ඨ නායකයාට සමස්ත ලංකා බෞද්ධ සම්මේලනය සදා ණයගැති වෙයි.

ලෝක බෞද්ධ ප්‍රජාව උදෙසා ඔහු විසින් ඉටු කරනු ලැබූ අතිශයින් වැදගත් කාර්යයන් අතුරින් එකක් නම් 1950 මැයි මස පිහිටුවනු ලැබූ “ලෝක  බෞද්ධ මිත්‍රත්ව සමුළුවයි.” එය ලෝකයේ එතෙක් පවත්වනු ලැබූ ප්‍රථම බොදු සමුළුව වන අතර රටවල් 29 කින් නියෝජිතයින් 129 ක් සහභාගී වූ  මහා පරිමාණයේ සමුළුවක් විය.  මෙම සමුළුව, ලොව වටා වසන බෞද්ධ ජනයා තුළ යම් එකඟතාවයක් ඇතිවීමට හේතු වූ අතර ඔවුන්ගේ ක්‍රියාකාරිත්වයේ සැළකිය යුතු ප්‍රගතියක් ඇති වීමට ද මං පාදන ලදී.  මහැදුරු ගුණපාල මලලසේකර විසින් පොදුවේ මෙරට සමාජයට සහ විශේෂයෙන් බෞද්ධ ජනතාවට ඉටු කරනු ලැබූ අතිවිශාල සේවාව වචනවලින් පවසා නිම කළ නොහැක.

ගුණපාල මලලසේකර ශ්‍රීමතාණන් සෝවියට් රුසියාවේ ප්‍රථම ශ්‍රී ලංකා තානාපති තනතුරට 1957 වසරේත් ඉන් අනතුරුව චීනය, චෙකොස්ලෝවැකියාව, යුගෝස්ලෝවැකියාව, පෝලන්තය හා රුමේනියාව ආදී රටවල තානාපති තනතුරු සහ කැනඩාවේ  මහ කොමසාරිස් ලෙසත්,  එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිත  හා  1963 සිට 1967 දක්වා එක්සත් රාජධානියේ ශ්‍රී ලංකා මහා කොමසාරිස් තනතුරත්  හෙබවීය.

උසස් පිළි ගැනීමක් ඇති විද්වතකු වූ ඔහු බෞද්ධාගමේ විවිධ අංශ පිළිබඳ දැනුමැති, ලෝක ප්‍රකට පර්යේෂකයින්ගේ සහභාගිත්වය ඇතිව 1956 සිට බෞද්ධ විශ්ව කෝෂය ඇරඹීමට මූලිකත්වය ගනු ලැබීය.

නොවැම්බර් මස 09 දිනට උපන් දිනය යෙදෙන මෙම උදාර විද්වතා උදෙසා සමස්ත ලංකා බෞද්ධ සම්මේලනයේ වත්මන් සභාපති ලෙස සම්මේලනයේ අනෙකුත් ක්‍රියාකාරීන් සමඟ එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරමි.

චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ.
ගරු සභාපති.
සමස්ත ලංකා බෞද්ධ සම්මේලනය.

ලි/MR/17/11/05